# අනගාරික ධර්මපාල බහුවිධ සමාජ කාර්යභාරය පිළිබඳ අධ්‍යයනයක්

**රෝහණ ලක්ෂ්මන් පියදාස[1], ධම්මික බණ්ඩාර හේරත්[2], දර්ශන සම්පත් සෝමරත්න[3], මංගල කීර්ති ද පැස්කුවල්[4]**

*[1,2,3,4]ජනසන්නිවේදන අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව.*
*[2*]dammika@kln.ac.lk*

දහනව වන සියවස අගභාගය සහ විසිවන සියවස මුල් කාල සීමාව තුළ ශ්‍රී ලාංකේය සමාජ, දේශපාලන, ආර්ථික හා සංස්කෘතික ස්ථාවරය බටහිර අධිරාජ්‍යවාදී අවශ්‍යතා මත ගොඩනැගේ. ඊට ප්‍රතිවිරෝධීව එම යුගයේ බිහි වූ මතවාදී හා ක්‍රියාකාරිකයෙක් ලෙස අනගාරික ධර්මපාලතුමා හඳුනාගත හැකිය. මෙම පර්යේෂණයේ අරමුණ වන්නේ දොන් ඩේවිඩ් හේවාවිතාරණ අනගාරික ධර්මපාල බවට පත්වීමත් පසුව සිරි දේවමිත්ත ධර්මපාල බවට පත්වීමත් යන කාලත්‍රය තුළ අනගාරික ධර්මපාල සමාජාභිවෘද්ධිය මෙහෙවර අධ්‍යයනය කොට රූප මාධ්‍යයට නැගීමයි. සමාජීය, ආර්ථික, අධ්‍යාපනික, සංස්කෘතික හා දේශපාලන ප්‍රවේශයන්ගෙන් අනගාරික ධර්මපාල චරිතයෙහි බිහිවීම සහ ජාතික සහ ජාත්‍යන්තර වශයෙන් ව්‍යාප්තවීම මෙන්ම ඊට බලපෑ ඔහුගේ මෙහෙවර පර්යේෂණයේදී අධ්‍යයනයට ලක්විය. පර්යේෂණය සඳහා පූර්ව ග්‍රන්ථ පරිශීලනය මෙන්ම සම්මුඛ සාකච්ඡා සහ සහභාගීත්ව නිරීක්ෂණය යන ක්‍රමවේද යටතේ ගුණාත්මක දත්ත රැස්කරනු ලැබීය. දේශීය මෙන්ම ජාත්‍යන්තර වශයෙන් ධර්මපාල චරිතය හා සමාජ මෙහෙවර සමග බැඳී පවත්නා ආගමික හා සමාජ ආයතන, අධ්‍යාපනික ආයතන මෙන්ම පුස්තකාල හා කෞතුකාගාර දත්ත රැස්කිරීමේදී යොදා ගන්නා ලදී. පෙරපර දෙදිග භාෂා ශාස්ත්‍රඥයෙක්, රාජ්‍ය සේවකයෙක්, සමාජ සේවකයෙක්, දේශකයෙක්, සටන් කථිකයෙක්, ලේඛකයෙක්, පුවත්පත් කලාවේදියෙක්, ව්‍යාපාරිකයෙක්, දේශප්‍රේමියෙක්, බෞද්ධ අධ්‍යාපන පුනරුදයේ පුරෝගාමියෙක්, පරාර්ථකාමියෙක් හා යතිවරයෙක් ලෙස බහුවිධ ක්ෂේත්‍ර ඔස්සේ අනගාරික ධර්මපාලතුමන්ගේ සමාජ සේවා කාර්යභාරය විහිදී යන අතර ලෝක ප්‍රකට පෞරුෂයක් ලෙස අනගාරික ධර්මපාලතුමන්ගේ චරිතය ගොඩනැඟීම සඳහා එම බහුවිධ සමාජ කාර්යභාරයන් හේතු වී ඇති ආකාරය රූප මාධ්‍යයෙන් ඉදිරිපත් කෙරේ.

මුඛ්‍ය පද ඃ මෙහෙවර, බුද්ධ ශාසනය, අධ්‍යාපනය, පරාර්ථකාමිත්වය, දේශප්‍රේමිත්වය